

# ජංගම දූරකථනය හා නූතන ශ්‍රී ලංකාවේ තාරුණ්‍යය

මිනිසා යනු ලොව සිටින දියුණුතම සත්ත්වයා ය. මිනිසා ගේ පරිණාමයත් සමඟ ඔහු විසින් සොයා ගැනුණු නව නිපැයුම් සිදුකරන ලදී. තාක්‍ෂණය ද මිනිසා විසින් සොයා ගන්නා ලද්දකි. ඒ ඔස්සේ විවිධ අත්හදා බැලීම් ද සිදුකරමින් ඉදිරියට යන මානව සමාජය අද වන විට විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත.

1973 දී Martin Cooper නමැති විද්‍යාඥයා විසින් ප්‍රථම වරට ජංගම දූරකථනය හඳුන්වා දීමත් සමඟ ජංගම දූරකථන භාවිතය ව්‍යාප්ත වූ අතර එය විවිධ මාදිලියට ලෝකයේ ව්‍යාප්ත වූයේ ගෝලියකරණයත් සමඟ ය. අද ජංගම දූරකථන හරහා හිතමිතුරු, ඥාති සබඳතා යන ජාලගත සබඳතා පවත්වා ගෙන යාමට මෙන්ම දැනුම හුවමාරු කරගන්නා පූර්ව තෝතැන්න ලෙස ද ජංගම දූරකථන භාවිත වේ.

විටෙක එය පාළුව, තනිකම දුරුකරන්නට උපයෝගී කර ගන්නා තරුණ පරපුර, පෙර පැවති මුහුණට මුහුණ සිදුකරනු ලබන කතාබහ වෙනුවට ජංගම දූරකථන මාධ්‍ය හරහා තම ජාලගත සබඳතා වර්ධනය කරගනු දැකගත හැක. තරුණ පරපුර යනු රැඩිකල් මතවාද දරණ, බුද්ධිමත් මෙන් ම නව සොයා ගැනීම් පසුපස හඹා යන මානව අදහස් ඇති ජවසම්පන්න පරම්පරාවකි. අද වනවිට තරුණ පරපුර අතර ජංගම දූරකථනය විලාසිතාවක් බවට පත් වී හමාර ය. වර්තමානයේ ජංගම දූරකථන තාක්‍ෂණය ඇන්ඩ්‍රොයිඩ් තාක්‍ෂණය දක්වා දියුණුවීමත් සමඟ තරුණ පරපුර වටා mobile phone culture එකක් නිර්මාණය වී ඇත. ඒ ඔස්සේ ඔවුන්ට ම ආවේණික භාෂාවක්, සංකේත භාවිතාවක් යොදා ගෙන තරුණ අනන්‍යතාවක් ගොඩ නඟා ගෙන ඇත.

1977 දී විවෘත ආර්ථිකය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමත් සමඟ අද වන විට ජංගම දූරකථන රැල්ලට හසු වී සිටින තරුණ පරපුර නොයෙක් අවශ්‍යතා සපුරා ගැනීමට ජංගම දූරකථන භාවිත කරන අතර ශ්‍රී ලංකාව ගත් කල ජංගම දූරකථන භාවිතාව වැඩිහිටි පරපුර අභිබවා තරුණ පරපුර ඉදිරියෙන් සිටින බවට කිසිදු සැකයක් නැත. අද වනවිට තරුණ පරපුර ඔවුන් ගේ ජාලගත සබඳතා පවත්වා ගෙන යෑමට හා ඒවා රැක ගැනීමට mobile phone තාක්‍ෂණය භාවිත කිරීම මඟින් සාමාජීය සංස්කෘතික බලපෑමක් ලංකාවේ තරුණ පරපුර තුළ ගොඩ නැඟෙමින් තිබෙන බවක් වර්තමාන සමාජය දෙස බලන කල අපට වැටහෙන්නකි. අද තරුණ කොටස් උසස් තාක්‍ෂණයෙන් යුත් ජංගම දූරකථන මිලදී ගැනීමේ රැල්ලට හසු වී හමාර ය. ජංගම දූරකථන භාවිත වහර හා හොඳ මෙන් ම නරක ද සමාජ ගත වී හමාර ය. ඇතැම් තරුණයන් ජංගම දූරකථන තාක්‍ෂණය හරහා නව සොයා ගැනීම්, අධ්‍යාපන අරමුණු සාර්ථක කර ගැනීමට යොදා ගන්නා අතර ඇතැම් රැඩිකල් මතවාද දරණ තරුණ කණ්ඩායම් ජංගම දූරකථන තාක්‍ෂණය අවභාවිතය සඳහා යොදා ගනු ලබයි.

මිනිසුන් අතර සබඳතා ගොඩනැඟිය යුතු ය. මුළු ලෝකය ම අන්තර්ජාලය හේතුවෙන් විශ්ව ගම්මානයක් බවට පත් ව ඇති යුගයක ඒ අන්තර් සබඳතා දුරස් කර ශ්‍රී ලංකිකයන් වන අපට හුදකලා වීමට නො හැකි ය. ගැටලුව නම් එය නොව ජංගම දූරකථන තාක්‍ෂණය භාවිතයේ ඇති වරද ය.

අද ශ්‍රී ලංකාව තුළ සිදුවන ජංගම දූරකථන අපරාධ රැල්ල ද අපට අමතක කළ නො හැකි ය. ජංගම දූරකථන හරහා තරුණ තරුණියන් ගොඩනඟා ගන්නා අලුත් බැඳීම් බිඳ

වැටීම හේතු කොටගෙන සියදිවි නසා ගැනීමට පෙළඹෙන ආකාරයක් සහ තරුණ දරුවන් සියදිවි නසා ගත් අවස්ථා මෑතකදී ලංකාව තුළ අපට දැක ගන්නට හැකි විය. දියුණු වන ලෝක තුළ තාක්‍ෂණය දියුණු විය යුතු මය. එහෙත් තාක්‍ෂණයේ දියුණුවීම සංස්කෘතියේ හෝ සමාජයේ පරිහානිය නොවිය යුතු ය. අද තරුණ පරපුර වටහා නො ගන්නේ ද එය මය.

නව රැල්ලට හසු වී බටහිරකරණයට ගැති වී ඒවා අනුකරණය කිරීමට උත්සාහ දැරීම අමනකමකි. එය ලංකාවේ සංස්කෘතියට සමාජයට උචිත දෙයක් නොවන බව ශ්‍රී ලාංකිකයන් වන අප වටහාගත යුතු ය.

අද තරුණ කොටස් ඕනෑම තාක්‍ෂණයක් ගැන මනා අවබෝධයකින් යුක්ත ය. අවාසනාව නම් අද සමාජයේ බොහෝ මව්පියන්ට ගුරුවරුන්ට තාක්‍ෂණයේ භාවිතාව පිළිබඳ දැනුම නොමැතිකම ය.

වරද තාක්‍ෂණයේ දියුණුව නොව තාක්‍ෂණය පරිහරණය කරන ක්‍රමවේදයේ ඇති වරද ය. බටහිර රටවල නම් ඒ ඒ රටවල සංස්කෘතියට ගැළපෙන දේවල් සිදුවූවාට කම් නැත. එහෙත් ශ්‍රී ලංකාව වැනි බෞද්ධ රටකට බටහිරකරණයෙන් ලැබෙන හැම දෙයම සුදුසු නැති බව වටහා ගත යුතු ය.

එක්තරා තරුණියන් පිරිසක් ජංගම දුරකථනය හරහා සබඳතා ගොඩනගා ගනිමින් මිනිසුන් ගේ ධනය සූරා කමින් පවුල් සබඳතා බිඳ දමන ක්‍රියාවල නිරත වූ පුවතක් එක්තරා පුවත්පතක පළ වී තිබිණි. ඔවුන් තමන් ගේ පැවැත්ම සඳහා කරන මෙවැනි ක්‍රියා තාරුණ්‍යයට උචිත දෙයක් නො වේ.

අවුරුදු 13 සිට 19 දක්වා අතර වයස් කාණ්ඩවල යෞවන යෞවනියන් නවීන සමාජයේ ජංගම දුරකථන රැල්ලට හසු වී හමාර ය. ඔවුන් එය යහපතට වඩා අවභාවිතයට යොදා ගත් නිසා සියදිවි නසා ගත් අවස්ථා ප්‍රවෘත්ති වාර්තාවලින් අපට කොතෙකුත් අසන්නට ලැබුණි.

තාරුණ්‍යය යනු කිසියම් වැඩිහිටියෙකු උපදෙසක් හොඳ අවවාදයක් දුන්විට එය පිළිගන්නා තත්ත්වයට සිටින පරම්පරාවක් නොවුණත් ඔවුන්ට ඔවුන්ගේම බුද්ධිය ආමන්ත්‍රණය කර හොඳ නරක දෙක වටහා ගත හැකි ව සිටින කාලයකි.

ජංගම දුරකථන හරහා කුමන කාර්යයක් කළ ද තමන් තම පමණ දැන බුද්ධියෙන් සිතා කටයුතු කරනවා නම් කොපමණ දියුණු තාක්‍ෂණයක් වුව ද සමාජ ගත වූවාට කම් නැත. ප්‍රශ්නය නම් එය නොව මෙය වටහා ගන්නේ අතළොස්සක පිරිසක් වීම ය.

මෙවැනි තත්ත්වයක් මත ශ්‍රී ලංකාව, රජයක් ලෙස මුහුණු පොත තහනම් කිරීම හෝ ජංගම දුරකථන භාවිතයට නියම වයස් සීමාවක් පැනවීම වත් නොව කළයුතු වන්නේ, තරුණ පරපුරේ මානසික මට්ටම සකසමින් තාක්‍ෂණය නිවැරදිව භාවිත කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ ව ඔවුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් දියත් කිරීම ය. ගෙදරින්, දෙමාපියන් ගෙන් දුරස් වන ළමයා කුමක් කරන්නේ ද යන්න සොයා බැලීම දෙමාපියන් ගේ ද වගකීම ය. විවේකය ලැබෙන හැම මොහොතකම දරුවන් පරිගණක ක්‍රීඩා (game play) කරන්නට හෝ internet සඳහා දැන් භාවිත කරනුයේ ජංගම දුරකථනයයි. මේ ඔස්සේ ළමයා හා දෙමාපියන් අතර පවතින සබඳතා දුරස් වීමට හේතු සාධක වී ඇත.

මිනිසා සොයා ගන්නා ලද තාක්‍ෂණයට මිනිසා ම බිලිවන යුගයක් දැන් අපට දැක ගත හැකි ය. තරුණ පරපුර නව තාක්‍ෂණය හඹා ගියාට කම් නැත. වරද වන්නේ තාක්‍ෂණය භාවිත කරන ආකාරයයි. තාක්‍ෂණයේ අවභාවිතය තාරුණයේ අවසානය නොවිය යුතු ය. තරුණ හඬ, තරුණ ජවයට බුද්ධිය ද අවශ්‍ය ය. ජංගම දුරකථන තාක්‍ෂණය දියුණු වූවාට කම් නැත. එය භාවිත කිරීමේ දී තරුණ පිරිස් ලෙස කළ යුත්තේ 'වඳුරන්ට දැලිපිහිය අසුවූවා සේ' භාවිත කිරීම නොව ඵල සහිත ක්‍රියාවලට යොදා ගැනීම ය. හොඳට නරකට දෙකටම භාවිත කළ හැකි ජංගම දුරකථන භාවිතය අන්තර් සබඳතා ගොඩ නැඟීමට යහපත් වූවත් ඒ පිළිබඳ ව මනා අවබෝධයකින් හා එහි පවත්නා හානිකර බව ද වටහා ගෙන සිටීම වඩා සුරක්ෂිත බව මා හැඟී අදහසයි.■

**මධූ ජයසේකර**

